සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**29 | S | II**

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සියලු සන්නිවේදන වර්ගයන්ගේ පදනම වන්නේ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි. එහි ප්‍රයෝජන හතරක් දක්වන්න. **(ලකුණු 2)**
    (ii) කාර්යාලීය කටයුතුවලදී ලිඛිත සන්නිවේදනය බහුල ව භාවිතා කෙරේ. එහි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
    (iii) 'බෝ නොවන රෝග' පිළිබඳ ව පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශනයේ දී වෛද්‍ය නිළධාරීතුමාට සිසු අවධානය ලබා ගැනීමට තරමක් අපහසු විය. එම තත්ත්වය මග හරවා ගැනීමට ඔහුට යොදා ගත හැකිව තිබූ උපක්‍රම තුනක් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**
    (iv) වර්තමානයේ මාධ්‍ය භාවිතය තුළ සමාජ මාධ්‍ය වෙත වැඩි අවධානයක් යොමු වී ඇත. සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම් දෙකක් හා අයහපත් බලපෑම් දෙකක් ඇතුළත් කරමින් සඟරාවකට ලිපියක් ලියන්න. **(ලකුණු 8)**

02. (i) රූපවාහිනී මාධ්‍ය භාවිතය ළමයින්ගේ සමාජ සබඳතා දුරස් කිරීමට හේතු වී ඇති බව පර්යේෂණයක් මගින් අනාවරණය කර ගනු ලැබූයේ කවුරුන් විසින් ද? **(ලකුණු 2)**
    (ii) සන්නිවේදන අධ්‍යයන විෂයයේ සංවර්ධනය සඳහා බලපෑ කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
    (iii) මාධ්‍ය සාක්ෂරතාවයේ දී විවිධ මානයන් මගින් තොරතුරු රැස් කිරීම සිදු වේ. එවැනි මානයන් හතරක් නම් කර දෙකක් උදාහරණය මගින් විස්තර කරන්න. **(ලකුණු 6)**
    (iv) ගෝලීය සංස්කෘතියේ ලක්ෂණ ශ්‍රී ලංකාව තුළින් ද ගම්‍යමාන වේ. කරුණු හතරක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

03. (i) මාධ්‍ය සංදේශයක් තුළ අන්තර්ගත වන තොරතුරු වර්ග දෙකක් නම් කරන්න. **(ලකුණු 2)**
    (ii) මාධ්‍ය සංදේශ විචාරය කිරීම සඳහා විවිධ දෘෂ්ටිවාද යොදා ගැනේ. එවැනි දෘෂ්ටිවාද දෙකක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
    (iii) නිර්මාණකරුවෙකුට නිර්මාණාත්මක රචනයේ දී අවශ්‍ය වන මූලිකාංග හතරක් නම් කර දෙකක් විස්තර කරන්න. **(ලකුණු 6)**
    (iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය කරුණු හතරක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

04. (i) පාසල් අධ්‍යාපනික සිද්ධි අවස්ථා දෙකක් නම්කරන්න. **(ලකුණු 2)**
    (ii) මහජන සම්බන්ධතා ආයතනයක් වශයෙන් පාසල මහජන සම්බන්ධතාවය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
    (iii) ජනමාධ්‍යට සුවිශේෂ වූ කාර්ය භාරයයන් හතරක් නම් කර දෙකක් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**
    (iv) ආයතන කළමණාකරුවෙකු වූ සරත් සිය කාර්යාලීය කටයුතුවලදී සිරුර බස (Body Language) යොදා ගනිමින් සන්නිවේදනයේ යෙදෙන ආකාර හතරක් විස්තර කරන්න. **(ලකුණු 8)**

05. (i) විදුලි සංදේශ නියාමන කොමිසම මගින් සිදු කරන කාර්යයන් දෙකක් දක්වන්න. **(ලකුණු 2)**

(ii) දැන්වීම්කරණය හා මහජන සම්බන්ධතාවය අතර ඇති වෙනස්කම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

(iii) මාධ්‍ය නියාමනය කාලීන අවශ්‍යතාවයකි. කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

(iv) සිද්ධි කළමනාකරුවෙකු වශයෙන් ඔබ ත්‍යාග ප්‍රදානෝත්සව අවස්ථාවක් සැලසුම් කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න. **(ලකුණු 8)**

06. (i) සංවර්ධනය පිළිබඳ ඩඩ්ලි සියර්ස් ඉදිරිපත් කළ නිර්වචනය ලියන්න. **(ලකුණු 2)**

(ii) ලාංකික සමාජය තුළ පවතින දරිද්‍රතාවය පිටු දැකීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

(iii) ජනශ්‍රැති හා ජනකලා නූතන නිර්මාණකරණය තුළ යොදා ගෙන ඇති ආකාරය අවස්ථා තුනක් ඇසුරින් විස්තර කරන්න. **(ලකුණු 6)**

(iv) මාධ්‍ය මගින් සංස්කෘතියට කර ඇති බලපෑම කරුණු හතරක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

07. (i) පහත සඳහන් ෂැනොන් හා වීවර් ආකෘතියේ A, B, C, D අංග නම් කරන්න. **(ලකුණු 2)**




(ii) සංවර්ධන සංකල්පයේ නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් දක්වන්න. **(ලකුණු 4)**

(iii) පුවත්පත් ආචාර ධර්ම තුනක් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

(iv) සංවර්ධන ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකාව මුහුණු දී ඇති ගැටලු හතරක් නිදසුන් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**